රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :- 18/2016

මගේ අංකය : EST-6/LEAVE/03/3238
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2016.08.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## <u>ආයතන සංග්‍රහයේ XV වන පරිච්ඡේදයේ 10:1 උප වගන්තියෙහි උප ලේඛනය සංශෝධනය කිරීම</u>

ආයතන සංග්‍රහයේ XV වන පරිච්ඡේදයේ 10:1 උප වගන්තිය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එම උප වගන්තියේ සඳහන් උප ලේඛනයේ II කොටස හා III කොටස පහත පරිදි සංශෝධනය කිරීමට 2016.06.14 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

**<u>II කොටස - ගරු අග්‍රාමාත්‍යතුමාගේ අනුමතිය ලබා ගත යුතු නිලධරයන්</u>**

- සභානායකවරයාගේ ලේකම්
- ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයාගේ ලේකම්
- මහ ලේකම්වරයා හැර සියලුම පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලය
- දිස්ත්‍රික් ලේකම්වරු / දිසාපතිවරු
- රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරීන්හී සහ වත්කම් වැඩි ප්‍රමාණයක් රජය සතු සමාගම්වල පාලක මණ්ඩලයන්හි සභාපතිවරු ( මෙම උපලේඛනයේ I කොටස යටතේ සඳහන් වූ සභාපතිවරු හැර)

**<u>III කොටස - අදාළ ගරු අමාත්‍යතුමාගේ අනුමතිය ලබා ගත යුතු නිලධරයන්</u>**

- අමාත්‍යාංශයන්හි අතිරේක ලේකම්වරු
- ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්, පළාත් සභා සහ පළාත් පාලන විෂයභාර ගරු අමාත්‍යවරයා වෙතින්
- දෙපාර්තමේන්තු ප්‍රධානීන්
- රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරීන්හී සහ වත්කම් වැඩි ප්‍රමාණයක් රජය සතු සමාගම්වල පාලක මණ්ඩලයන්හි උප සභාපතිවරු
- රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, අධිකාරීන්හී සහ වත්කම් වැඩි ප්‍රමාණයක් රජය සතු සමාගම්වල පාලක මණ්ඩලයන්හි ක්‍රියාකාරී අධ්‍යක්ෂවරු
- අනිකුත් සියලුම විධායක/ මාණ්ඩලික මට්ටමේ නිලධරයන් ඇතුළුව සියලුම රාජ්‍ය නිලධරයන් (පළාත් සභාවල හා පළාත් පාලන ආයතනයන්හී සේවයේ නියුක්ත නිලධරයන් හැර)
- රාජ්‍ය සංස්ථාවන්හි/ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි/ වත්කම් වැඩි ප්‍රමාණයක් රජය සතු සමාගම්වල විධායක/ මාණ්ඩලික මට්ටමේ නිලධරයන් ඇතුළුව සියලුම නිලධරයන්

ජේ.ජේ. රත්නසිරි

ලේකම්

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය